# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 63 දරන තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2009 අංක 63 දරන තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 30 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 17/2007.

**තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

" බඩල්ගම තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද මෙම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 63 දරන තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව "තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තාලියවක ආනන්ද බෝධි සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කර ඇත්තේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.:—

(අ) බෞද්ධාගමට වැදගත්කමක් ඇති ඓතිහාසික ස්ථාන සහ ජාතික වැදගත්කමක් ඇති බවට පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියක් මගින් හෝ එවැනි නීතියක් යටතේ ප්‍රකාශයට පත් කර ඇති අදාළ පෞරාණික වස්තුන් සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා සෑම ආකාරයකින්ම සහාය සහ ආධාර ලබා දීම ;

(ආ) ජාතික වැදගත්කමක් ඇති බවට පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියක් මගින් හෝ එය යටතේ ප්‍රකාශයට පත් කර ඇති ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් බෞද්ධයන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පරිසර හිතකාමී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඇ) නිවාස පහසුකම් ලබා ගැනීමට අදාළව බෞද්ධයන් වන ආර්ථික වශයෙන් දුබල තත්ත්වයේ සිටින ගොවි පවුල්වලට ආධාර සැපයීම ;

(ඈ) පවත්වාගෙන යාමට අපහසු තත්ත්වයක සිටින බෞද්ධයන් සඳහා පිහිටුවන ලද පෙර පාසල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සහ එවැනි පාසල්වල අධ්‍යාපන කටයුතු වල නියැලෙන ලෙස සුදුසුකම් ලත් ගුරුවරුන් දිරිමත් කිරීම ;

(ඉ) බෞද්ධයන් අතර සිටින විරැකියා තරුණයන්ගේ යහපත උදෙසා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම ;

(ඊ) බෞද්ධයන් බහුතරයක් සිටින අඩු ආදායම් සහිත පුද්ගලයන් වෙසෙන ගම්මානවල ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම, සහ බෞද්ධයන් අතර ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය ලබා දීම ;

(ඌ) වන සම්පත් ආරක්ෂා කිරීමට බෞද්ධයන් සඳහා ප්‍රජා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වනාන්තර නැවත වගා කිරීම සඳහා වූ ප්‍රජා ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා සහාය ලබා දීම සහ ජාතික වැදගත්කමක් ඇති බවට පාර්ලිමේන්තුව මගින් සාදන ලද නීතියක් මගින් හෝ එය යටතේ ප්‍රකාශයට පත් කර ඇති පසෙහි සශ්‍රීක බව අඩු කිරීම වැළැක්වීම සඳහා ස්වාභාවික පස සංරක්ෂණ ක්‍රම දිරිමත් කරන අතර ම බෞද්ධයන් අතර නවීන පස සංරක්ෂණ ක්‍රම හඳුන්වාදීම සඳහා වූ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඌෟ) ජාතික වැදගත්කමක් ඇති බවට පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියක් මගින් හෝ එය යටතේ ප්‍රකාශයට පත් කර ඇති කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණය කිරීම සහ දේශීය කෘෂිකර්මය නංවාලීම සඳහා සහාය ලබා දීම.

දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය සහ ණය ගැනීම යනාදිය පිළිබඳව සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට හා දැරීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට සහ දැරීමට ;

(ආ) විධායක කමිටුවේ අනුමැතිය ඇතිව සංස්ථාවේ කාර්යය සඳහා රජය විසින් අනුමත කරන ලද විදේශීය හා දේශීය බැංකු හා වෙනත් ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යෑමට හා වැසීමට ;

(ඇ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් මුදලක් විධායක කමිටුවේ සාමාජිකයන් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, ප්‍රදාන, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) සංස්ථාව විසින් අත් කරගෙන ඇති හෝ සංස්ථාව සන්තකයේ ඇති යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන නීතිමය භාර සහ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට ;

(එ) සංස්ථාවේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට ; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට

සංස්ථාවට බලතල ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම, විධායක අධ්‍යක්ෂ/සභාපති/ලේකම්, භාණ්ඩාගාරික, උපසභාපති, පරිපාලන හා ප්‍රචාරක ලේකම්, උපලේකම් සහ සම ලේකම්වරුන් තිදෙනකුගෙන් සමන්විත විධායක කමිටුවක් විසින් 8 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව, මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ විධායක සභාවේ ධූර දරන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

**6.** සංස්ථාවේ ආදායම හා දේපළ මෙහි දක්වා ඇති අරමුණු ප්‍රවර්ධනය කර ගැනීම සඳහා පමණක් අදාළ කර ගත යුතු අතර, එහි යම් කොටසක් ලාභාංශ, ණය, ප්‍රසාද දීමනා, ලාභ හෝ අන්‍යාකාරයකට ඍජුව හෝ වක්‍රව සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය. සංස්ථාවේ ආදායම සහ දේපළ අදාළ කර ගැනීම.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරීම, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාව නමින් සංස්ථාවේ විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය හැකි ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් විධායක මණ්ඩලය විසින් ඇති කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් ඒ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**8.** (1) පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට අඩු නොවන බහුතර ඡන්ද සංඛ්‍යාවකින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධාරීන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, හෝ ධූරය හිස් කිරීම, ධූරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල චර්යාව සහ කාර්යය ;

(ඇ) විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ එහි බලතල, චර්යාව සහ කාර්යය හා ඔවුන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව සහ කාර්යය සහ කර්තව්‍ය ;

(ඉ) විධායක සභාවේ රැස්වීම් කැඳවීම, ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වනු ලබන වේලාවන්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍රය සහ ගණපූරණය සහ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ ඒවා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සෑදූ ආකාරයෙන් සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය තිබෙන අතර, ඒ සියලු දේපළ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු බව.

11. සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු අතර, සංස්ථාවේ ලාභ හෝ ලාභාංශ කිසිවක් වේ නම් ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

12. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු ව තිබූ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදින පදනමට අයවිය යුතුව තිබුණු සියලුම ණය මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

13. සංස්ථාවේ ණය සහ බැරකම් බේරුම් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයන් සඳහා සංස්ථාවේ කිසිම සාමාජිකයකු, එම සාමාජිකයාගේ සාමාජික ගාස්තුව වශයෙන් අයවිය යුතු මුදලට වැඩි මුදලක් දායක මුදලක් වශයෙන් ගෙවීමට යටත් නොවන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

14. සංස්ථාවේ මුද්‍රාව විධායක කමිටුව විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු අතර, සභාපති සහ විධායක කමිටුවේ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිට දී මිස, කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සනක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

15. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුනොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තාවූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නාවූ ද, වෙනත් යම් ආයතනයක හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

16. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

17. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.